## 2020/05/12 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

2020/05/12 දින පෙ.ව. 9.00 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 7. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 12. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 13. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 14. | එඩේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 16. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 17. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 18. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 19. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 21. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 22. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 25. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 26. | බී.ජී.අරුණ ශාන්ති මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 27. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |

**01. ආගම සිහි කිරීම**

2020.05.12 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

## 02. මූලාසනයේ පිළිගැනීමේ කතාව

සුභ උදෑසනක් වේවා සියලුම දෙනාට. ඉතිහාසයේ ප්‍රථම වතාවට මුඛ ආවරණ පැළඳ ගෙන, දුරස්ථභාවය රැකගෙන, අද 2020 මැයි මස 12 වැනිදා. නාගොඩ ප්‍රාදේශීය සභාවේ මාසික සභා රැස්වීම පවත්වන්නට සිදු වී තියෙනවා. කොරෝනා වසංගත තත්වය නිසා අප්‍රේල් මස මහා සභාව පවත්වන්නටත් නොහැකි වුනා. මෙම වසංගතය නිසා මුළු ලෝකයම අක්‍රීය වුනා. ලෝකයේ බලවත් රටවල් අක්‍රීය වන විට ශ්‍රී ලංකාව මෙම වසංගතය මැඩලීමට සාර්ථකව කටයුතු කළ නිසා අපේ රට වාසනාවන්ත වුණා. ඒ සඳහා මූලිකත්වය ගත් ත්‍රිවිධ හමුදාව, පොලීසිය සහ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සියළුම දෙනාට පළමුව අපගේ කෘතඥතාවය පළ කර සිටිනවා. එවැනි වාතාවරනයක් තුල අද සභා රැස්වීම ඉතා කෙටි කාලයකට සීමා කරන අතර, මේ අවස්ථාවට සහභාගී වී සිටින ගරු උප සභාපතිතුමා ඇතුලු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා, ගරු මන්ත්‍රීතුමියන්ලා සියලු දෙනාම මම ඉතා ගෞරවයෙන් පිළිගන්නවා. මම කවදත් බලාපොරොත්තු වෙන පරිදි සභාව ඉදිරියට කරගෙනයාමට ඔබ සියලු දෙනාගේ සහයෝගය අපේක්ෂා කරමින් මගේ පිළිගැනීමේ කතාව අවසන් කරනවා.

## (අ)01. පසුගිය වාර්තාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම

01. ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් 2020.03.10 දින සභා වාර්තාවේ ඉදිරි ගෙවීම් වල අංක 26 යටතේ ඇති ගෙවීම 2020.03.10 දින සභිකයන් වෙත ලබා දුන් ඉදිරි ගෙවීම් වාර්තාවේ සඳහන් නොවු බවත්, එමෙන්ම සභිකයන්ට ලබා දුන් ඉදිරි ගෙවීම් වාර්තාවෙහි අංක 01- 35 දක්වා ඉදිරි ගෙවීම් සඳහන් වී ඇති නමුත් සභා වාර්තාවේ ඉදිරි ගෙවීම් යටතේ අංක 01- 36 දක්වා ඉදිරි ගෙවීම් සඳහන් වී ඇති බවත්, සභා වාර්තාවේ ඉදිරි ගෙවීම් යටතේ වැඩිපුර ගෙවීමක් සිදු කර ඇති බවත් පෙන්වා දෙන ලදී.
ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතාද මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින්, ප්‍රකාශ කර සිටියේ, සභිකයන් වෙත ලබා දුන් ඉදිරි ගෙවීම් වාර්තාවෙහි අංක 26 යටතේ යටලමත්ත ගොවි සංවිධානයට කරන ලද ගෙවීම සඳහන් වී තිබූ බවත්, සභා වාර්තාවේ ඉදිරි ගෙවීම් යටතේ එම ගෙවීම අංක 27 යටතේ ඇතුලත් වී අංක 26 ට ලංකා හොස්ට් වෙබ් සොලියුෂන් ප්‍රයිවට් ලිමිටඩ් සඳහා කරන ලද ගෙවීමක් ඇතුලත් වී ඇති අතර එය මහා සභාවේ අනුමත කරන ලද ගෙවීමක් නොවන බැවින් මෙම ගෙවීම සම්පූර්ණ වැරදි බැවින්, අනුමත කල නොහැකි බව සඳහන් කළේය.

## (අ)02. 2020.03.10 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.

2020.03.10 දින පැවති මහා සභාවේ සභා වාර්තාවෙහි ඉදිරි ගෙවීම් වල අංක 26 යටතේ ඇති ගැටළුකාරී ගෙවීම හැර ඉදිරි ගෙවීම් වාර්තාව ඇතුලත්ව සභා වාර්තාව සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස **ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ආ). සභාපති තුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

නැත

**(ඇ). සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

01. පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් 2020.04.28 දිනැතිව පළාත් පාලන ආයතනවල කමිටු රැස්වීම්/ මහා සභා රැස්වීම්/ විශේෂ මහා සභා රැස්වීම් පැවැත්වීම සම්බන්ධයෙන් උපදෙස් සහිතව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

02. 252-6478 දරණ කැබ් රථයට අලුතින් බැටරියක් ලබා ගැනීම සම්බන්ධව රියදුරු බී.ජී.පියතිලක මයා විසින් 2020.03.27 දිනැතිව යොමු කරන ලද ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී.

03. ධර්මදාස පුස්සවලගේ මයා වෙත දීර්ඝකාලීන බදුකරයක් ලබා දීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය විසින් 2020.03.13 යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

04. අධික වියලි කාලසීමාව තත්වය තුල ප්‍රාදේශීය සභාව විසින් අසීරුතාවයට පත් වූ බල ප්‍රදේශයේ ජනතාවට ජලය බෙදා හැරීම සම්බන්ධ 2020.04.10 දින දක්වා වූ විස්තර වාර්තාව සභා ගත කරන ලදී

05. වැඩිහිටි සංවිධානය , කුරුපනාව විසින් ඇඩ්වින් මහතාගේ නිවස සිට ජයවීර මහතාගේ නිවස දක්වා වූ ගඟ අද්දර මාර්ගය මීටර් 100 ක් පමණ කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ රැඳවුම් මුදල් ලබා ගැනීම සම්බන්ධව 2020.05.11 දිනැතිව යොමු කරන ලද ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී.

06. කුරුපනාව ගොවි සංවිධානය , කුරුපනාව විසින් පංසල පාර (ප්‍රියදර්ශනාරාමයට යන පාර) කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ රැඳවුම් මුදල් ලබා ගැනීම සම්බන්ධව 2020.05.11 දිනැතිව යොමු කරන ලද ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී.

07. කුරුපනාව ගොවි සංවිධානය , කුරුපනාව විසින් නාගොඩවත්ත මාර්ගය කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීමේ කර්මාන්තයෙහි රැඳවුම් මුදල් ලබා ගැනීම සම්බන්ධව 2020.05.11 දිනැතිව යොමු කරන ලද ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී.

08. කුරුපනාව ගොවි සංවිධානය, කුරුපනාව විසින් මාපලගම වත්ත හරහා දිවෙන මලාමුර පෝද්දිවල වතු මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තයෙහි රැඳවුම් මුදල් ලබා ගැනීම සම්බන්ධව 2020.05.11 දිනැතිව යොමු කරන ලද ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී.

09. කුරුපනාව ගොවි සංවිධානය , කුරුපනාව විසින් තල්ගස්වල වත්ත නොම්මර 02 කෝවිල මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තයෙහි රැඳවුම් මුදල් ලබා ගැනීම සම්බන්ධව 2020.05.11 දිනැතිව යොමු කරන ලද ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී.

10. ඌරල අරුග්ගොඩ මාර්ගය සම්බන්ධව ගරු මන්ත්‍රී එන්.ඩබ්.පතිනායක මහතා විසින් යොමු කරන ලද ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී.

11. WPRW 8886 දරණ ට්‍රේලරය අළුත්වැඩියා කිරීම සුදුසු බවට උපදෙස් සඳහන් යාන්ත්‍රික ඉංජිනේරු එම්.ආර්.එම්.රිස්වි මහතා විසින් 2020.04.29 දිනැතිව යොමු කරන ලද වාර්තාව සභා ගත කරන ලදී.

**(ඈ). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

නැත.

**(ඉ). යථා පරිදි කල් දී ඇති යෝජනා**

**(ඉ). 1. ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩ විතාන මහතා ඉදිරිපත් කරන පරිපාලන යෝජනා.**

1. නාගොඩ ප්‍රාදේශීය සභාව යටතේ පාලනය වන උඩුගම නැගෙනහිර රන්කැකුළු පෙර පාසලෙහි පෙර පාසල් පාලිකාව වන එම්.කේ. සංජීවනි තිළිනි කුමාරි මහත්මිය 2020 ජුනි මස සිට ප්‍රසූත නිවාඩු ලබා ගැනීමට අපේක්ෂාවෙන් සිටී. නාගොඩ ප්‍රාදේශීය සභාව විසින් ගිවිසගෙන ඇති ගිවිසුම ප්‍රකාරව දරු ප්‍රසූතිය සඳහා හිමි වන්නේ වැටුප් රහිත නිවාඩුව පමණි. නමුත් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 4/2005 අනුව කොන්ත්‍රාත්, අනියම් සේවයේ නියුතු අය සඳහා ප්‍රසූත නිවාඩු කාලය තුලත් අදාළ වැටුප් ගෙවීමට අනුමත කර ඇති බැවින් ඒ අනුව ගිවිසුම සංශෝධනය කර වැටුප් සහිත ප්‍රසූත නිවාඩු ලබා දීමට අවශ්‍ය කටයුතු කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ධනංජය විලේගේ මහතා ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

2. රියදුරු බී.ජී.පියතිලක මයාගේ ඉල්ලීම පරිදි 252-6478 දරණ කැබ් රථයට අලුතින් බැටරියක් මිළදී ගැනීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රීනී සුභාෂි ඒකනායක මෙනවිය ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

3. LL 7103 ටිපර් රථය අළුත්වැඩියා කිරීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

4. WPRW 8886 දරණ ට්‍රේලරය යාන්ත්‍රික ඉංජිනේරු එම්.ආර්.එම්.රිස්වි මහතාගේ උපදෙස් අනුව අළුත්වැඩියා කිරීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

I. **ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම**

**අංක 01 සිට 30 දක්වා ඇති ඉදිරි ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීමට යෝජනා කරමි.**

**2020.05.12 දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව.**

**01.ලංකා විදුලිබල මණ්ඩලය**
**2020 මාර්තු මස විදුලි බිල්පත්**

2813038709 - කැකුළු පෙර පාසල - රු. 240.00
8619142704 - රන්කැකුළු පෙර පාසල - රු. 441.30

4501090200 - මාපලගම වෙළඳ සංකීරණ කොරිඩෝව - රු. 423.00
2810236100 - මාපලගම කරුණාතිලක ක්‍රීඩාංගනය - රු. 240.00
4593739918 - මාපලගම උප කාර්යාලය - රු. 1081.80
2810125104 - දීප්ති පෙර පාසල - රු. 258.30
4594192319 - උඩුගම උප කාර්යාලය - රු. 3076.50
8617046104 - උඩුගම බහුකාර්‍ය මධ්‍යස්ථානය
(2020 පෙබරවාරි මස දක්වා හිඟ විදුලි ගාස්තු) - රු. 2602.50

**02.ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය**

33/53/003/008/11 - උඩුගම උප කාර්යාලය (2020.02.19 – 2020.03.19) -රු. 6025.23
33/53/003/009/10 - උඩුගම බහුකාර්ය මධ්‍යස්ථානය (2020.02.20- 2020.03.19) -රු. 2089.61
33/53/003/008/11 - උඩුගම උප කාර්යාලය (2020.03.19 – 2020.04.21) -රු. 1000.80
33/53/003/009/10 - උඩුගම බහුකාර්ය මධ්‍යස්ථානය (2020.03.19- 2020.04.21) -රු. 639.90

**03 .2020 මාර්තු මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සඳහා)**

| | | |
|---|---|---|
| දිලිනි දිසානායක මිය | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 3460.00 |
| කුසල් අසංක එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5169.00 |
| කේ.ජී.ජයනි මිය | - සංවර්ධන නිලධාරී | -රු. 2500.00 |
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | -ආදායම් පරීක්ෂක | -රු . 4000.00 |
| මානෙල් සුදර්ශනී මිය | -සංවර්ධන නිලධාරී | - රු. 3240.00 |

**04. 2020 මාර්තු මස**

**ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්**

| | | |
|---|---|---|
| මධුර ප්‍රභාත් මයා | - කා.කා.ස. | - රු. 1560.00 |

**පුහුණු වැඩසටහන් සඳහා**

| | | |
|---|---|---|
| දිලිනි දිසානායක මිය | -තාක්ෂණ සේවා නිලධාරි | - රු. 924.00 |
| එන්.එච්.ඩී.නිරෝෂණී මිය | - කළමනාකරණ සහකාර | - රු. 876.00 |

**05. අතිකාල දීමනා ගෙවීම්**

**2020 මාර්තු මස**

| | | |
|---|---|---|
| මධුර ප්‍රභාත් මයා | - කා.කා.ස. | - රු. 1081.50 |
| රංජිත් උදය කුමාර මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 5950.00 |
| බී.ජී.පියතිලක මයා | - රියදුරු | - රු. 4308.00 |
| ජී.එල්.උපුල් ධර්මසිරි | -වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු.1959.37 |

**2020 අප්‍රේල් මස**

| | | |
|---|---|---|
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු. 9046.40 |
| ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා | - මුරකරු | - රු. 7862.00 |
| ඒ.එච්.ජී. සංජීව මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු (මුර සේවයේ යෙදීම වෙනුවෙන්) | - රු. 8666.66 |
| යසරත්න විජේසේකර | - මුරකරු | - රු.11016.00 |
| එන්.එම්.රජිත මයා | - අනියම් මුරකරු | - රු. 8080.00 |
| ඩබ්.කේ. සම්පත් සංජීව මයා | - අනියම් රියදුරු | - රු. 8593.00 |
| කේ. එච්. එම්. කැළුම් චාමර මයා | - අනියම් රියදුරු | - රු. 5434.00 |

| | | |
|---|---|---|
| අයි.කේ.ඉන්දික කුමාර මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 2420.00 |
| එම්.ඩබ්.හර්ෂ කුමාර මයා | - සෞඛ්‍ය කම්කරු | - රු. 3366.00 |
| ඩී.සමන් ප්‍රදීප් මයා | - සෞඛ්‍ය කම්කරු | - රු. 4998.00 |
| චමිත් නිශාන්ත මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 3793.39 |
| එම්.එම්. මහින්දදාස මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 6174.81 |
| රංජිත් උදය කුමාර මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 8500.00 |
| බී.ජී. දයානන්ද මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | -රු. 8666.40 |
| කේ.කේ.අවන්ත පද්ම මයා | - කා.කා.ස. | - රු. 1123.50 |
| මධුර ප්‍රභාත් මයා | - කා.කා.ස. | - රු. 3553.00 |
| කේ.පී.ජී. ප්‍රසන්න මයා | -වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 5362.50 |

**2020 අප්‍රේල් මස ගමන් වියදම්**

**ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්**

| | | |
|---|---|---|
| නිමල් වික්ටර් නාගොඩවිතාන මයා | - ගරු සභාපති | -රු. 1000.00 |
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | -රු. 1400.00 |

**2020 මැයි මස ගමන් වියදම්**

**ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්**

| | | |
|---|---|---|
| කේ.කේ.අවන්ත පද්ම මයා | - කා.කා.ස. | - රු. 350.00 |

**06.සී/ස යක්කලමුල්ල විවිධ සේවා සමූපකාර සමිතිය**

**2020 මාර්තු මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්**

| | |
|---|---|
| LL 7366 ට්‍රක් බවුසරය ඩීසල් ලීටර් 300 | - රු. 31200.00 |
| RA 8570 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 40 ක් | - රු. 4160.00 |
| Lo 3592 ලොරි බවුසරය ඩීසල් ලීටර් 150 | - රු. 15600.00 |
| **එකතුව** | **- රු. 50960.00** |

**07. ලංකා පිලිං ස්ටේෂන්, ගා/නාගොඩ**

**2020 අප්‍රේල් මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්**

| | |
|---|---|
| PF 7360 කැබ්රථය ඩීසල් ලීටර් 477ක් | - රු. 49608.00 |
| 252-6478 කැබ් රථය ඩීසල් ලීටර් 110 ක් | - රු. 11440.00 |
| LL 7650 කෘ කැබ් රථය ඩීසල් ලීටර් 275 ක් | - රු. 28600.00 |
| LL 7366 ට්‍රක් බවුසරය ඩීසල් ලීටර් 332 ක් | - රු. 34528.00 |
| Lo 3592 ලොරි බවුසරය ඩීසල් ලීටර් 200 | - රු. 20800.00 |
| RA 8570 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 40 ක් | - රු. 4160.00 |
| RA 8569 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 110 ක් | - රු. 11440.00 |
| **එකතුව** | **- රු.160576.00** |

**08. ලේකම්, නාගොඩ ප්‍රාදේශීය සභාව**

| | |
|---|---|
| 2020.මාර්තු මාසයට අදාල දින වැටුප් ලබා ගැනීම | - රු. 7035.75 |

**09. විගණකාධිපති, විගණන කාර්යාලය**

| | |
|---|---|
| හිඟ විගණන ගාස්තු ගෙවීම | - රු.10000.00 |

**10. අබේනායක ඔටෝ සර්විස්, ගාල්ල**

PF 7360 කැබ් රථය සේවා කිරීමේ බිල්පත - රු. 20780.00

LL 7650 කෘ කැබ් රථය සේවා කිරීමේ බිල්පත - රු. 18440.00

**11. ශ්‍රීනිත් රුක්ෂාන් මයා, උඩුගම**

උඩුගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම 2020 මාර්තු - රු. 4010.00

**12. සේන මෝටර්ස් ඇන්ඩ් සර්විස්, නාගොඩ**

LL 7650 කෘ කැබ් රථය අළුත්වැඩියා කිරීමේ බිල්පත - රු. 9000.00

**13. එදිරිසිංහ මෝටර්ස්, උඩුගම**

252-6478 කැබ් රථය අළුත්වැඩියා කිරීමේ බිල්පත - රු. 17335.00

**14.ඒ.කේ.නිලන්ති සජීවනී,ග්‍රාෆ් ටෙල් කමියුනිකේෂන්**

i. සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට 2020 මාර්තු මස දුරකථන පෙර ගෙවුම් කාඩ්පත් ලබා දීමේ බිල්පත පියවීම -රු28500.00

ii. සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට 2020 අප්‍රේල් මස දුරකථන පෙර ගෙවුම් කාඩ්පත් ලබා දීමේ බිල්පත පියවීම -රු28500.00

iii. 2020 මාර්තු මස සභා වාර්තාව පිටපත් 30 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම් - රු. 2520.00

**15. එල්.එස්.ආර්. විජේතිලක මයා,ගා/නාගොඩ**

නාගොඩ ප්‍රාදේශීය සභා කැකුළු පෙර පාසල පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල බඳු පදනම මත පවත්වා ගෙන යන බැවින් ඒ සඳහා මැයි මස මාසික කුලීය ගෙවීම - රු. 5000.00

**16. සුමනරත්න විජේතිලක මයා, උඩවැලිවිටිය**

උඩවැලිවිටිය බොරගොඩ පොදු ළිඳ ඉසීම වෙනුවෙන් මුදල් ගෙවීම - රු. 1500.00

**17. කේ.වී.ඩී.ලක්දේව මයා,**

කැප්පිටියාගොඩ සෙනවිරත්න මාවත අසල ඇති තොටුපලට යන මාර්ගය හා තොටුපල පිළිසකර කිරීමේ බිල්පත - රු. 4050.00

**18. ටී.ජී.හාඩ්වෙයාර්, නාගොඩ**

පානීය ජලය ලබා දීමේ වැඩසටහනට අදාළ උපකරණ මිළදී ගැනීමේ බිල්පත - රු. 2145.00

**19. නානායක්කාර හාඩ්වෙයාර්, නාගොඩ**

පානීය ජලය ලබා දීමේ වැඩසටහනට අදාළ උපකරණ මිළදී ගැනීමේ බිල්පත - රු. 775.00

**20. ඒ.ජේ.ජී. ස්ටේෂනරිස්, ගාල්ල**

A4 පැකට් 43 ක් ලබා ගැනීමේ බිල්පත - රු. 26875.00

කාර්යාලීය ලිපිද්‍රව්‍ය ලබා ගැනීමේ බිල්පත - රු. 15804.00

**21.** **චාමින් හාඩ්වෙයාර්, තල්ගස්වල**

1. LO 3592 බවුසරයේ තීන්ත ආලේප කිරීමට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබාගැනීම - රු. 8810.00
2. LO 3559 වතුර බවුසරයේ ඇතුලත විස්තාරනය කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම - රු. 570.00

**22.** **සෙන්ට්‍රල් ෆාමසි, පිටිගල**
ප්‍රාදේශීය සභා සේවකයින් සඳහා ග්ලවුස් බොක්ස් එකක් මිළදී ගැනීමේ බිල්පත - රු. 2800.00

**23.** **දයානි ට්‍රේඩ සෙන්ටර්, මාපලගම**
ප්‍රධාන කාර්යාලයේ විදුලි පංකාවට රෙගියුලේටර් එකක් මිලදී ගැනීමේ බිල්පත - රු. 1166.00

**24.** **යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය**
සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී සඳහා දීමනා ගෙවීම (2020 මාර්තු) - රු.13000.00

**25.** **සිසිර ජයමාන්න මයා, පොලිසීය අසල, උඩුගම**
2020 පෙබරවාරි මස 11 පැවති මහ සභා රැස්වීමට අදාල සංග්‍රහ වියදම් බිල්පත
(කෑම සහ තේ සඳහා) - රු. 9500.00

**26.** **තල්ගස්වල ඔටෝ ඉලෙක්ට්‍රිකල්ස්**
252-6478 කැබ් රථයේ අළුත්වැඩියා කිරීමේ වියදම් - රු. 2370.00

**27.** **එස්.බී.ප්‍රින්ටර්ස්, මීගමුව**
මුද්‍රිත ලේඛන ලබා ගැනීමේ බිල්පත - රු. 11720.00

**28.** **සුගතපාල මැන්දිස්, රත්ගම**
පොත් ලබාගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම - රු. 1500.00

**29.** **වික්‍රම් කන්ස්ට්‍රක්ෂන්, උඩුගම**
අතිගරු ජනාධිපතිතුමා කොතලාවල පංසලට පැමිණීම නිමිත්තෙන් ඉදිකල වැසිකිලි
පද්ධතිය සඳහා අමුද්‍රව්‍ය ලබා ගැනීමේ බිල්පත වැලි - රු. 14300.00
ගල් - රු. 6000.00 - රු. 20300.00

**30.** **ආසිරි ඔටෝ සර්විස්, මාපලගම**
LL 7650 කෘ කැබ් රථයට අලුතින් ටයර් 04 ක් සවි කිරීමේ ගාස්තුව - රු. 900.00

**ඉදිරි ගෙවීම් වාර්තාවේ සදහන් ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් කල යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**(ඉ).2 කර්මාන්ත යෝජනා**

**(ඉ) 2. ගරු සභාපතිතුමන් හා ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා.**

**(ඉ)3. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

I. ඌරල ලියනගේවත්ත අරුග්ගොඩ මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කිරීම -රු. 53000.00
**අරුග්ගොඩ මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කිරීම සම්බන්ධව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුව සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රී එන්.ඩබ්ලිව්.පතිනායක මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

II. LL 7103 ටිපර් රථයේ අළුත්වැඩියාව සඳහා උඩුගම මෝටර් ඉංජිනියර්ස් විසින් ලැබී ඇති දළ ඇස්තමේන්තුව - රු. 306705.00

**LL 7103 ටිපර් රථයේ අළුත්වැඩියාව සම්බන්ධව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුව සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ).4 මිළ ගණන් ඉදිරිපත් කිරීම**

**01. පරිගණක මොනිටර්, හෙඩ් සෙට්, U.P.S, යූ.එස්.බී. වයිෆයි ඇඩප්ටර් ලබා ගැනීම සඳහා ලැබී තිබූ මිළ ගණන්**

| විස්තරය | ඊබේස් කොම්පියුටර් ටෙක්නොලජී, මාපලගම | ප්‍රිවීව් කොම්පියුටර් ටෙක්නොලජී, වදුරඹ | රුචිර කොම්පියුටර්, නාගොඩ |
|---|---|---|---|
| පරිගණක මොනිටර් | රු. 14000.00 | රු. 14350.00 | රු. 14250.00 |
| හෙඩ් සෙට් | රු. 1400.00 | රු. 1550.00 | රු. 1500.00 |
| U.P.S | රු. 4900.00 | රු. 5000.00 | රු. 4950.00 |
| යූ.එස්.බී. වයිෆයි ඇඩප්ටර් | රු. 1350.00 | රු. 1450.00 | රු. 1450.00 |

**පරිගණක මොනිටර්, හෙඩ් සෙට්, U.P.S, යූ.එස්.බී. වයිෆයි ඇඩප්ටර් මිළදී ගැනීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කල ඊබේස් කොම්පියුටර් ටෙක්නොලජී, මාපලගම විසින් පරිගණක මොනිටර්, හෙඩ් සෙට්, U.P.S, යූ.එස්.බී. වයිෆයි ඇඩප්ටර් මිළදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. අඩුම මිළ ගණන් ඉදිරිපත් කල ඊබේස් කොම්පියුටර් ටෙක්නොලජී, මාපලගම වෙතින් පරිගණක මොනිටර්, හෙඩ් සෙට්, U.P.S, යූ.එස්.බී. වයිෆයි ඇඩප්ටර් මිළදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රි ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**01.** වාහන අමතර කොටස් සඳහා ලැබී තිබූ මිළ ගණන්

| **විස්තරය** | | නිව් විජය මෝටර්ස්, ගාල්ල | | ආසිරි ටයර් ට්‍රේඩර්ස්, ඇතුමලේ | | මුතුහෙට්ටිගම ටයර් සෙන්ටර්, උඩුගම |
|---|---|---|---|---|---|---|
| 650 × 16 ටයර් | Ceat | 14100.00 | Ceat | 14200.00 | Ceat | 14325.00 |
| 650 × 16 ටියුබ් | Ranweli | 1490.00 | Ceat | 1850.00 | Arpico | 1500.00 |
| 650 × 16 රිම් ටේප් | Midland | 550.00 | Ceat | 550.00 | Arpico | 550.00 |
| 600 × 12 ටයර් | Ceat | 8000.00 | Ceat | 8080.00 | Ceat | 8240.00 |
| 600 × 12 ටියුබ් | DSI | 950.00 | Ceat | 980.00 | Arpico | 950.00 |
| 600 × 12 රිම් ටේප් | | - | Ceat | - | | - |
| 750 × 16 ටයර් | Ceat | 20100.00 | Ceat | 20200.00 | Ceat | 20440.00 |
| 750 × 16 ටියුබ් | DSI | 1950.00 | Ceat | 2350.00 | Arpico | 1600.00 |
| 750 × 16 රිම් ටේප් | Midland | 550.00 | Ceat | 550.00 | Arpico | 550.00 |
| 600 × 16 ටයර් | Ceat | 11600.00 | Ceat | 11650.00 | Ceat | 12257.00 |
| 600 × 16 ටියුබ් | DSI | 1700.00 | Ceat | 1750.00 | Arpico | 1250.00 |
| 600 × 16 රිම් ටේප් | Midland | 550.00 | Ceat | 550.00 | | |
| 12.4 × 28 ටයර් | Ceat | 48100.00 | Ceat | 48250.00 | Ceat | 50571.00 |
| 12.4 × 28 ටියුබ් | Ceat | 6100.00 | Ceat | 6250.00 | Arpico | 5500.00 |
| 12.4 × 28 රිම් ටේප් | | - | Ceat | - | | - |
| 900 × 20 ටයර් | Ceat | 35900.00 | Ceat | 36000.00 | Ceat | 37900.00 |
| 900 × 20 ටියුබ් | DSI | 2400.00 | Ceat | 2800.00 | Arpico | 2650.00 |
| 900 × 20 රිම් ටේප් | Midland | 700.00 | Ceat | 650.00 | Arpico | 600.00 |
| 825 × 20 ටයර් | Ceat | 30200.00 | Ceat | 30350.00 | Ceat | 30786.00 |
| 825 × 20 ටියුබ් | Shakthi | 2500.00 | Ceat | 2680.00 | Arpico | 2450.00 |
| 825 × 20 රිම් ටේප් | Midland | 700.00 | Ceat | 650.00 | Arpico | 600.00 |
| 265 × 70 × 16 ටයර් | Maxxis AT 700 | 31900.00 | Maxxis AT 700 | 32175.00 | | 33500.00 |
| 205 × 70 × 16 ටයර් | Maxxis MT753 | 23400.00 | Maxxis MT753 | 23600.00 | | 25200.00 |
| ටියුබ්ලස් වැල් කරවල් | | 150.00 | | 200.00 | | 250.00 |

වාහන අමතර කොටස් ගෙන්වීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කල නිව් විජය මෝටර්ස්, ගාල්ල විසින් වාහන අමතර කොටස් ගෙන්වීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. අඩුම මිළ ගණන් ඉදිරිපත් කල නිව් විජය මෝටර්ස්, ගාල්ල වෙතින් වාහන අමතර කොටස් ගෙන්වීම සුදුසු බව ගරු මන්ත්‍රීනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සහා සම්මත විය.

**02.** වාහන සේවා කිරීම සඳහා ලැබී තිබූ මිළ ගණන්

| **විස්තරය** | **වර්ගය** | **ආසිරි ටයර් ට්‍රේඩර්ස්, ඇතුමලේ** | **මුතුහෙට්ටිගම ටයර් සර්විස්, උඩුගම** | **අබේනායක ඔටෝ සර්විස්, ගාල්ල** |
|---|---|---|---|---|
| ඩිපරන්සල් ඔයිල් ලීටර 01 | | 850.00 | 875.00 | 860.00 |
| ග්‍රීස් නිපල් 01 ක් ගැසීමට | | 60.00 | 70.00 | 60.00 |
| බ්‍රයිටෝල් ලීටර් 01 | | 40.00 | 50.00 | 35.00 |
| ඩී.එස්. ඔයිල් ලීටර් 01ක මිල | | 400.00 | 580.00 | 560.00 |
| යට තෙල් ගැසීමට ඔයිල් ලීටර් 01 | | - | 450.00 | 400.00 |
| ලාම්පුතෙල් ලීටර 01 | | 100.00 | 110.00 | 90.00 |
| ගියර් ඔයිල් ලීටර් 01 ක මිල | | 850.00 | 890.00 | 840.00 |
| බැටරි වතුර බෝතල් 01 ක මිල | | 100.00 | 90.00 | 80.00 |
| බ්‍රේක් ඔයිල් මිලි ලීටර් 250 | | 345.00 | 500.00 | 450.00 |
| **ඩබල් කැබ් රථ** | | | | |
| A/C ෆිල්ටර් | | | 4500.00 | 4250.00 |
| සේවා කිරීමට | | 3200.00 | 3350.00 | 3100.00 |
| ඩීසල් ෆිල්ටර් 01 ක මිල | වී.අයි.සී | 3950.00 | 4000.00 | 3900.00 |
| ඔයිල් ෆිල්ටර් 01 ක මිල | වී.අයි.සී | 2495.00 | 2550.00 | 2490.00 |
| එයාර් ෆිල්ටර් 01 ක මිල | වී.අයි.සී | 5680.00 | 5750.00 | 5600.00 |
| වාහනය ඇතුලත සේදීම හා පිටත සේදීම | | 800.00 | 800.00 | 750.00 |
| **හාඩිමෙක් රථය** | | | | |
| සේවා කිරීමට | | 3500.00 | 3550.00 | 3400.00 |
| ඩීසල් ෆිල්ටර් 01 ක මිල | වී.අයි.සී | - | 2800.00 | 2760.00 |
| ඔයිල් ෆිල්ටර් 01 ක මිල | වී.අයි.සී | - | 2700.00 | 2580.00 |
| එයාර් ෆිල්ටර් 01 ක මිල | වී.අයි.සී | - | 5520.00 | 5450.00 |
| වාහනය ඇතුලත සේදීම හා පිටත සේදීම | | 1000.00 | 1000.00 | 900.00 |
| **කියුබ් 03 ටිපර් රථය සහ ට්‍රක් බවුසර්** | | | | |
| සේවා කිරීමට | | 4000.00 | 4000.00 | 3850.00 |
| ඩීසල් ෆිල්ටර් 01 ක මිල | වී.අයි.සී | - | | - |
| ඔයිල් ෆිල්ටර් 01 ක මිල | වී.අයි.සී | 3875.00 | 4000.00 | |
| එයාර් ෆිල්ටර් 01 ක මිල | වී.අයි.සී | - | | |
| වාහනය ඇතුලත සේදීම හා පිටත සේදීම | | 1500.00 | 1650.00 | 1400.00 |
| **හාඩිමෙක් රථය** | | | | |
| සේවා කිරීමට | | 2000.00 | 2300.00 | 2100.00 |

| | | | | |
|---|---|---|---|---|
| **ඩීසල් ෆිල්ටර් 01 ක මිල** | **වී.අයි.සී** | 1800.00 | 1920.00 | 1850.00 |
| **ඔයිල් ෆිල්ටර් 01 ක මිල** | **වී.අයි.සී** | 800.00 | 950.00 | 850.00 |
| **එයාර් ෆිල්ටර් 01 ක මිල** | **වී.අයි.සී** | - | | |
| වාහනය ඇතුලත සේදීම හා පිටත සේදීම | | 800.00 | 1000.00 | 900.00 |
| **ට්‍රැක්ටර් (ටේලරය සහිතව)** | | | | |
| **සේවා කිරීමට** | | 3500.00 | 4000.00 | 3800.00 |
| **ඩීසල් ෆිල්ටර් 01 ක මිල** | **වී.අයි.සී** | - | 1750.00 | 1600.00 |
| **ඔයිල් ෆිල්ටර් 01 ක මිල** | **වී.අයි.සී** | 1400.00 | 1700.00 | 1500.00 |
| **එයාර් ෆිල්ටර් 01 ක මිල** | **වී.අයි.සී** | 1100.00 | | - |
| වාහනය ඇතුලත සේදීම හා පිටත සේදීම | | 1200.00 | 1700.00 | 1450.00 |

**වාහන සේවා කිරීම සදහා ලැබී තිබූ මිළ ගණන් අනුව හාඩිමෙක් රථය හා ට්‍රැක්ටර් සේවා කිරීම සඳහා අවම මිළ ගණන් ඉදිරිපත් කල ආසිරි ටයර් ට්‍රේඩර්ස්, මාපලගම විසින් හාඩිමෙක් රථය හා ට්‍රැක්ටර් සේවා කිරීමටද, ඩබල් කැබ් රථය, කෘ කැබ් රථය, ටිපර් රථ හා ට්‍රක් බවුසර් සේවා කිරීමට අවම මිළ ගණන් ඉදිරිපත් කල අබේනායක ඔටෝ සර්විස්, ගාල්ල වෙතින් ඩබල් කැබ් රථය, කෘ කැබ් රථය, ටිපර් රථ හා ට්‍රක් බවුසර් සේවා කිරීමටද ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. අඩුම මිළ ගණන් ඉදිරිපත් කල ආසිරි ටයර් ට්‍රේඩර්ස්, මාපලගම වෙතින් හාඩිමෙක් රථය හා ට්‍රැක්ටර් සේවා කිරීම සඳහා සුදුසු බවත්, අබේනායක ඔටෝ සර්විස්, ගාල්ල වෙතින් ඩබල් කැබ් රථය, කෘ කැබ් රථය, ටිපර් රථ හා ට්‍රක් බවුසර් සේවා කිරීම සුදුසු බවත් ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රි ධර්මසිරි ගනේවත්ත මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඊ) කාරක සභා වාර්තා**

i. 2020.03.13 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව ඉදිරිපත් කරන ලදී.

**(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා**

- 2020 මාර්තු මාසයට අදාල මාසික ඒකාබද්ධ ආදායම් සාරංශය සළකා බැලීම සඳහා මැයි මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම
- 2020 අප්‍රේල් මාසයට අදාල ආදායම් ලැබීම් හා වියදම් ගෙවීම් සළකා බැලීම සඳහා මැයිමස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම

**ගරු සභාපතිතුමා**

අපි අධ්‍යයන චාරිකාව ගියපු වෙලාවෙ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ බෙහෙත් නිකුත් කිරීම සම්බන්ධව පලවූ පුවත්පත් වාර්තාව පිළිබඳව පැහැදිලි කරන්න ඕන. එදා වෛද්‍යවරයාගේ අධීක්ෂණය යටතේ එම පුද්ගලයා එම ස්ථානයේ කම්කරු සේවය කරල තියෙන්නෙ. දැනට එම ස්ථානයේ සේවයේ යෙදී සිටින කෙනත් අදාල තනතුරේ කෙනෙක් නෙවෙයි. ගරු මන්ත්‍රීවරුනි, මම මේ සම්බන්ධව කතා කළේ. පත්තරේ තිබුන එකට උත්තරයක් හැටියට. ඒදා අධීක්ෂණය යටතේ මේ කටයුත්ත කළා කියලා පැහැදිලි කරන්න. නැත්නම් වැරදි වැටහීමක් ඇති වෙනවා. ඒකයි මම මේ පැහැදිලි කළේ.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, පටලවා ගන්න එපා. මෙතන කාර්යාලයෙත් කම්කරු පදනම යටතේ වැඩ කරනවා. අපි ඒක දන්නවා. අපට ඒ පුරප්පාඩුව පුරවන්න තියෙන විකල්පය නිසා තමයි, කාඩර් එක අනුව කම්කරු ඇබෑර්තු තියෙනවා. ඒ අනුව කම්කරුවන් බඳවගෙන වෙනත් ලිපිකරු ක්ෂේත්‍රයට දාල තියෙනවා. ලිපිකරු තනතුරුවලට බඳවා ගැනීමට අපට හැකියාවක් නැහැ.. නමුත් විදිහට ගනිපු නිලධාරිනියක් තමයි මෙපමණ කල් ආයුර්වේදයේ සේවය කළේ. දැනටත් මම හිතන්නෙ ඒ නිලධාරිනියමයි වැඩ කරන්නෙ. අපි ඒක දන්නවා. ඒ තොරතුරු මෙතන පොත්පත්වල තියෙනවා. මේක එහෙම නෙවෙයි. දැනට සේවය කරන නිලධාරිණිය නිවාඩු යන වෙලාවෙ දැනට මාර්ග කම්කරුවෙකු ලෙස සේවය කරන අයෙක් වැඩ ආවරණය කිරීම සඳහා යෙදවීම තමයි ගැටළුව. මේක පෞද්ගලික චරිත ඝාතනයක් නෙවෙයි. මොන අධ්‍යාපන මට්ටමේ ඉන්නවද කියලා මට කියන්න බැහැ. නමුත් මේ මොහොත වෙන කොට එයා කම්කරු මහත්මයෙක් හැටියට වැඩ කරනවා. නමුත් බෙහෙත් ටික කලවම් කරල දෙන එක වගකීමක් ඇති රාජකාරියක්. ඒ වගේ දෙයකට එහෙම නම්, ඊට වැඩිය ඒ ක්ෂේත්‍රයට ගැලපෙන, යමක් කිව්වාම තේරෙන කෙනෙක් යොදවන්න ඕන. මම මේවා විග්‍රහ කරන්න ගියොත්, එක එක පැතිකඩවලට හැරෙනවා. ඒක නිසා මම ඒ ගැන විග්‍රහ කරන්නෙ නැහැ. අපි උදාහරණයක් හැටියට ගත්තොත්, අද දවසේ ආයුර්වේදයේ සේවය කරන කෙනාට නිවාඩු යන්න ඕන නිසා, ඊයෙ පාර නෙලන්න ගියපු මහත්මයා බෙහෙත් කවලම්. කරන්න යොදවනවා. හරිද කියන එක තමුන්නාන්සෙලා තීන්දු කරන්න. එහෙම නැත්නම් මම අද ආයුර්වේදය වහනවා. මේක කරන්න බැහැ කියලා වෛද්‍යවරිය තීන්දු කරන්න ඕන. බෙහෙත වැරදුනා නම්, ප්‍රශ්නය ඔතන නෙවෙයි තියෙන්නෙ. ඒක නිසා ගියපු මහත්මයගෙ වැරැද්දක් නැහැ. ආයතන ප්‍රධානියෙක් කියනවා නම් මෙතනට යන්න කියලාඑතනට යනවා. ඒක නිසා ඒ කටයුත්තෙ වගකීම සම්පූර්ණයෙන්ම එම සේවකයා යොමු කරපු නිලධාරි භාර ගන්න ඕන. නැත්නම් වෛද්‍යවරිය භාර ගන්න ඕන. ගරු සභාපතිතුමනි, නිවාඩු ආවරණය කරන්න යොදවන්න ඕන, එහෙම නම් ඒ ක්ෂේත්‍රයේ කෙනෙක් වෙන්න ඕන. ගරුවරයා නිවාඩු ගියාම කාර්යාල කාර්යය සහායක ඒ පංතියට දාන්නෙ නැහැ. මොකද එහෙම කලොත් ළමයා නොමග යනවා. ඒ වගේම තමයි, මෙතනට මෙයා නිවාඩු ගියාම වෛද්‍යවරියට තිබුනා. එක්කො මම තනියම කරනවා, එහෙම නැත්නම් මේකට ගැලපෙන කෙනෙක් තෝරගන්නවා කියල තීරණය කරන්න. අනිත් එක මොන අධ්‍යාපන මට්ටමේ කෙනෙක් හිටියත් බෙහෙත් කවලම් කරන එක විශේෂ ඖෂධ වේදියෙකුට දෙන්න ඕන.

**ගරු මන්ත්‍රී ධනංජය විලේගේ මහතා**

ගරු විපක්ෂනායකතුමනි, මෙතන වෙලා තියෙන්නෙ සාමාන්‍යයෙන් වෙනදේ. වාරිකාව ගියා කියලා විශේෂයෙන් දෙයක් වෙලා නැහැ. ඒ ඉන්න කෙනා නිවාඩු ගියා නම් එතනට වැඩ ආවරනය කරන්න කෙනෙක් යොමු කරනවා. මෙතනත් වෙලා තියෙන්නෙ ඒක.

**ගරු උපසභාපතිතුමා**

ගරු සභාපතිතුමා මේක ප්‍රශ්නයක් ඒක ඔබතුමා තේරුම් ගන්න. ඒකට ඔබතුමා උත්තරයක් දෙන්න. ඒකට ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතාගෙ කට උත්තරයක් ඕන නැහැ. සභාපතිතුමා උත්තරයක් දුන්නාම ඇති.

**ගරු මන්ත්‍රී චන්ද්‍රසහබන්දු මහතා**

ගරු සභාපතිතුමා, උත්තර බඳින්න පුලුවන් වෙන්න ඕන. මන්ත්‍රීවරයෙකුට,මේ 27 දෙනාටම අයිතිය තියෙනවා. මම ප්‍රශ්නයක් ඇහුවනම් මට ප්‍රශ්නෙට උත්තරේ තමුන්නාන්සෙ කියනවනම් මෙන්න මේකෙයි කියලා. මුඛවාඩම් දැම්මට ඒකට උත්තර බැඳීමේ හැකියාව තියෙනවා.

**(ඌ) වෙනත් කරුණු :-**

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා**

ගරු සභාපතිතුමනි, ප්‍රධාන වශයෙන් කරුණු කීපයක් කතා කරන්න ඕන. අපි මේ කොරෝනා ප්‍රශ්නය ඇතිවෙච්ච වෙලාවෙ විශේෂ රැස්වීම් දෙකක් මේ ස්ථානයෙදි පැවැත්වුවා. ඒ රැස්වීම්වලදි අපි ගමේ අඩු ආදායම් ලාභී පවුල් කීපයක් තෝරගෙන ඔවුන්ට අවශ්‍ය වියලි සලාක හෝ වෙනත් ආධාර මුදලක් ලබාදීමට සභාවේ පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු සියලු දෙනා රැස්වෙලා තීන්දුවක් ගත්තා. ඊට පස්සෙ ඒ සම්බන්දව අපි කිසිම දෙයක් දැනුවත් වුනේ නැහැ. අපි ගම්වලට ගිහිල්ලා, මිනිස්සු රැස්කරලා ඔවුන්ට සභාව හරහා යම්කිසි සහනයක් සලස්වන බවට අපි ඒ මිනිස්සුන්ට බලාපොරොත්තුවක් දුන්නා. එහෙම කරලා දවස් දෙකකට විතර පස්සෙ අපිට ආරංචි වෙනවා. අපිට කතා කරල කියනවා. සභාවට බඩු ගේනවා හැබැයි මේව දෙන්නෙ මුදලට කියලා. එතකොට අපි දැඩි අපහසුතාවයකට පත්වෙනවා. ගමේ මිනිස්සුන්ට අපි කියලා තියෙන්නෙ ඔවුන්ට සහනයක් සලස්වනවා කියලා. ඒ අවස්ථාවෙදි ඒ සහනය සලස්වන්න අපට අවස්ථාව නැහැ කියලා දැන ගත්තාම, අපි ලොකු ගැටලුවකට මුහුණ දුන්නා. ඊට පස්සෙ දවස් දෙකකට විතර පස්සෙ නැවත දැනුම් දෙනවා. අපි සභාව රැස්වෙලා තීරණය කළේ බඩු මල්ලක් දෙන්න. නමුත් පස්සෙ අපි දැනුවත් වෙනවා එලවළු ගෙනැල්ල කියලා. ඒ පාර එලවළු ගෙන ඒම සම්බන්ධව දැනගත්තම අපි දැනුවත් වුනා ඒක සභාපතිතුමාගෙ පුද්ගලික මුදලක් කියලා. ඒ පාර අද අපි ආයෙ දැනුවත් වෙනවා. සභාපතිතුමාගෙ පුද්ගලික මුදලක් නෙවෙයි. ඒක සභාවෙන් ප්‍රතිපූර්ණය කරන්න ගත්ත මුදලක් කියලා. එතකොට මේ එලවළු ගෙනැල්ලා සභාවෙ වාහන දාගෙන බෙදුවා. මම හිතන්නෙ උඩුගම ගෝනදෙනිය අපේ කොට්ඨාසවලට නම් ආවෙ නැහැ. ලක්ෂ තුනක විතර එලවළු ගෙනාවා කියලා තමයි අපට ආරංචි වුනේ. මේ ගෙනාපු එලවළු පොළවල්වල ගෙනිහිල්ල විකුනුවා. පොලට එන වෙලෙන්දට වඩා අඩුවෙන් තමයි තල්ගස්වල පොලේ විකුනලා තිබුනෙ. පොළේ වෙලෙන්දො කිලෝ එක රුපියල් 100 ට විකුනනවනම් අපේ සභාවෙ වාහනේ ගිහිල්ල රුපියල් 80 ගානෙ විකුණනවා. එතකොට ගරු සභාපතිතුමනි, පොළේ වෙලෙන්දට ආදායමකුත් නැහැ. එතන ලොකු ගැටලුවක් ඇතිවෙනවා. ඒ විතරක් නෙවෙයි ගමේ කඩේ වෙලෙන්දා සභාවෙ වාහනෙන් රුපියල් 80 ට එලවළු අරගෙන ඇවිල්ලා රුපියල් 120 ට ගමේ විකුණනවා. ඔබතුමා කරපු වැඩෙන් සම්පූර්ණ ප්‍රයෝජන ගත්තෙ කොහෙවත් ඉන්න පිරිසක්. ඒ වගේම තමයි පතෝල, වැටකොලු ගෙනැල්ලා මේවා අපතේ දාපු ප්‍රමාණය ඉතාම ඉහලයි. අපි දැක්කා. අපි හොයලා බැලුවා. ඔබතුමා මේ මුදල් ප්‍රතිපූර්ණය කරන්නෙ නැත්නම් එතනත් ගැටලුවක් තියෙනවා. ඔබතුමාගෙ පුද්ගලික මුදල්වලට සභාවෙ සේවකයො දාගෙන සභාවෙ වාහන දාගෙන මේව කිරීම සම්බන්දව යම් කිසි ගැටලුවක් තියෙනවා. ගරු සභාපතිතුමනි, සහනයක් සිදු වුනෙත් නැහැ. මම දැනුවත්ව මේ වාහනය මෙච්චර දුර යන්න පුලුවන් එකක් නෙවෙයි කියන එක ඒ රියදුරු මහත්මයා කියල තියෙනවා. නමුත් එතුමට බල කරල තියෙනවා මේ ගමන යන්න. එතමා ගියා මම හිතන්නෙ ලක්ෂ තුනක එලවළු ගෙනාවනම්, ඒ වාහනය හදන්න දැන් ලක්ෂ දෙකහමාරක් යනවා. සභාවෙන් එලවළු ගේන්න තීරණය කරපු බවවත්, එලවළු ගේන බවවත්, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු වන අපි දන්නෙ නහැ. අපි යෝජනා කරල තියෙන්නෙ බඩු ගේන්න. මිනිස්සුන්ට වියලි ආහාර දෙන්න. ගරු සභාපතිතුමනි, සතොසෙ රුපියල් 100 ට තිබුන සැමන් ටින් එකයි පරිප්පු එකයි ගමට ගෙනිහිල්ල බෙදන්න ක්‍රමයක් සැලැස්සුවනම් ඔය

එලවළු බෙදුවට වැඩිය සහනයක් තියෙනවා. සභාවෙන් කරන සහනයක් කියන එක මම මේ අවස්ථාවෙ සඳහන් කරනවා. උඩුගම ප්‍රදේශයට ඔය එලවළු අවෙත් නැහැ. සහන මලු ආවෙත් නැහැ. මගේ කොට්ඨාසයට වතුර ආවෙත් නැහැ. ඔබතුමා කිව්ව කියලා පළාත් පාලන කොමසාරිස්තුමත් මට කතා කළා. සභාපතිතුමනි, මේ මුදල් පිළිබඳ කිසිම ගැටලුවක් නැහැ. එලවළු ගේන්න කලින් යෝජනා කළානම්, අපි ගම්වලට ගිහිල්ල බඩු මල්ලක් දෙනවා කියලා මිනිස්සුන්ට කියන්නෙ නැහැ. කලින් බඩු මල්ලක් දෙන්න යෝජනා කරලා ගම්වලට ගිහිල්ලා කමිටු හදලා මේක මිනිස්සුන්ට දෙන්න වැඩපිළිවෙලක් හදන්න කියල අපිට කිව්වෙ නැත්නම්, අපි මේ අපහසුතාවයට පත්වෙන්නෙ නැහැ.

ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, ඇප්ත්‍රොප්වත්තෙ අක්කර 35 ක ඉඩමක් අපට තිබුනා. අපට තිබුනා කියන්නෙ අපට පවරා ගැනීමට කටයුතු කරමින් තිබුනා. දැන් මේ වෙනකොට සභාපතිතුමනි, සභාව දැනුවත් කරන්න ඕන. අක්කර 35 න් අක්කර 30 ක්ම අල්ලලා තියෙන්නෙ. ඒ විතරක් නෙවෙයි කණගාටුවට කරුණ කොම්පෝස්ට් එක සඳහා තියෙන ඉතුරු අක්කර 05 ත් ඊයෙ වෙනකොට ප්‍රදේශවාසීන් අල්ලමින් තියෙනවා. මම හිතන්නෙ නීත්‍යානුකූලව සභාවට පියවරක් ගන්න බැහැ. මේකෙ අයිතිය තියෙන්නෙ ප්‍රාදේශීය ලේකම්තුමියට. නමුත් අපට සභාව විදිහට වගකීමක් තියෙනවා. මේක නීත්‍යානුකූල මාර්ගවලට යොමු කරල මේක රැක ගැනීම අපේ විශේෂ වගකීමක් කියන එක මම මේ අවස්ථාවෙ මතක් කරනවා. ඊලගට උඩුගම උක්ඕවිට ක්‍රීඩාංගනය සඳහා අපට අක්කරයක පමණ ප්‍රමාණයක් වත්තෙන් ලබාදීලා තියෙනවා. මේකෙ පුද්ගලික කෙනෙක් ඇවිල්ලා වගා කටයුතු කරමින් අත්පත් කර ගනිමින් ඉන්නවා. ඇප්ත්‍රොප්වත්තෙ අක්කර 30 ට ඇතුල් වුනේ සභාපතිතුමාගෙවත් කලින් සභාපතිතුමාගෙවත් කාලෙදි නෙවෙයි. අතරමැදි කාලෙදි තමයි අක්කර 30 අත්පත් කරගෙන තියෙන්නෙ. උක්ඕවිට පිට්ටනිය පිළිබඳවත් අවධානය යොමු කරන්න. ඒකටත් පුද්ගලයෙක් බලහත්කාරයෙන් ඇතුල්වෙලා කටයුතු කරමින් ඉන්නවා. ඒ සමගම සභාපතිතුමා කලිනුත් දැනුවත් කළා. ගරු සභාපතිතුමනි, මේ සභාවෙ වාහන ටික විනාශවෙමින් පවතිනවා. රියදුරන්ගේ අපරීක්ෂාකාරීකම නිසා වෙන්න ඇති. රියදුරන්ට විනය පරීක්ෂණ කරලා හරි කමක් නැහැ. මේ වාහන ටික හරියට නඩත්තු කරන්න කටයුතු සලස්වන්න. සේවා කිරීම, ඔයිල් මාරු කිරීම, නිසි වෙලාවට සිදු වෙනවා නම් ඔය දේ සිද්ද වෙන්නෙ නැහැ.

ඒ වගේම විශේෂයෙන් කියන්න ඕන. ආණ්ඩුකාරතුමා විසින් සභාවට ලක්ෂ 10 ක මුදලක් මුද්දර ගාස්තු වශයෙන් ලබාදීලා තියෙනවා. ගරු සභාපතිතුමනි, මම දැනගන්න කැමතියි. අපි දැක්කා නියාගම ප්‍රාදේශීය සභාව ගත්තම බොහොම සාර්ථක වැඩසටහන් ටිකක් ඉදිරිපත් කළා. මිනිස්සු අතරට බඩුටික ගෙනිච්චා. අවශ්‍ය අයට නිකන් බඩු දුන්නා. සහන මිලට බඩු දුන්නා. මේ හැම දේම කළා. ඒ නියාගම ප්‍රාදේශීය ලේකම්තුමිය හා ප්‍රාදේශීය සභාවෙ සභාපතිතුමා අපි දැක්කා. අපි ගිහිල්ල කතා කළා. නමුත් ගරු සභාපතිතුමනි, ඔබතුමා සභාව රැස් කරලා එක දෙයක් කියලා, සම්පූර්ණයෙන් ඒක වෙනස් කරලා කිසිම ඵල ප්‍රයෝජනයක් නැති දේවල් කිරීම තුලින් පිරිහීමට පත් වෙන්නෙ ඔබතුමා විතරක් නෙවෙයි සමස්ථ සභාවෙ අපි සියලු දෙනාම. මම දන්නෙ නැහැ කාගෙ උවමනාවට කොහොම කෙරුවද කියලා. අපෙන් අහන්නෙ ඔබතුමන්ලා නාගොඩ ප්‍රාදේශීය සභාවෙ මන්ත්‍රීවරු නේද? ඔබතුමන්ලා ජනතාවගෙ මුදලින් වැටුපක් ගන්නව නේද? ඔබතුමන්ලා අපට මොනවද කළේ කියලා. පහුගිය කොරෝනා සමයේ නාගොඩ ප්‍රාදේශීය සභාවෙ කටයුතු කිරීම පිළිබඳව දැඩි කණගාටුව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

ගරු සභාපතිතුමනි, මේ වෙලාවෙ ඉතාම කෙටි සභාවක් තිබුණත්, කොරෝනා වසංගතය හේතුවෙන් ශ්‍රී ලංකාවේ හැම කෙනාම පීඩනයට පත් වෙච්ච වෙලාවෙදි. රජයක් විදිහට අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ දූරදර්ශී ක්‍රියාකලාපය තුලින්, ලෝකයේ ඉතාම හොඳ රටක් බවට

පත් වෙන්න. ජනාධිපතිතුමාගෙ වැඩපිළිවෙල හරහා අවස්ථාව උදා වුනා. ඒ සඳහා විපක්ෂයේ සහයෝගයත් නිරන්තරයෙන් ලැබුනා. ඒ පිළිබඳව අපි හැම දෙනාම සතුටට පත්වෙනවා. ඒ නිසා ජන ජීවිතය යථා තත්වයට පත් කිරීම සඳහා රජයක් හැටියට අවස්ථා කීපයකදි වැඩිහිටි දීමනාව රුපියල් 5000 ක් දක්වා වැඩිකර ලබාදීමට කටයුතු කළා. ඒ වගේම වැඩිහිටි දීමනාව ලබාදීම සඳහා පොරොත්තු ලේඛනයේ විශාල පිරිසක් හිටියා. පොරොත්තු ලේඛනගතව සිටි ඒ සියලුම වැඩිහිටියන්ට රුපියල් 5000 ක සහනාධාරය ගිය මාසෙත්, මේ මාසෙත් ලබා දීමට කටයුතු කරලා තියෙනවා. ඒ වගේම වකුගඩු රෝගීන් සඳහා රුපියල් 5000 ක මුදලක් ලබා දෙන්නත්, වකුගඩු රෝගීන්ගෙත් පොරත්තු ලේඛනයක් තිබුනා. ඒ සියලු දෙනා සඳහා රුපියල් 5000 ක මුදල ලබා දීමටත්, ඒ වගේම සමෘද්ධි සහනාධාරය නොලබන සමෘද්ධි සහනාධාරය ලැබිය යුතුයි කියල පොරොත්තු ලේඛනයක් තිබුනා . ඒ පොරොත්තු ලේඛනයේ සියලු දෙනාට පාට පක්ෂ බේදයකින් තොරව රුපියල් 5000 ක මුදල ලබා දීමට කටයුතු කළා. ඒ වගේම සමෘද්ධි ලාභීන් සඳහා රුපියල් 5000 ක මුදල ලබා දුන්නා. ඒ වගේම කොරෝනා වෛරසයෙන් ජන ජීවිතය අහිමි වුනු, ව්‍යාපාර කඩා වැටුණු සියලු දෙනාට පක්ෂ, පාට බේදයකින් තොරව රුපියල් 5000 ක මුදලක් අප්‍රේල් මාසෙත් ලබා දුන්නා. ඒ වගේම මේ මාසෙ 18 වෙනිදයින් පස්සෙ 25 වෙනිද දක්වා ඒ මුදල් ගෙවන්න බලාපොරොත්තු වෙනවා. ඒ නිසා මේක පක්ෂ පාට බේදයකින් තොරව සෑම කොට්ඨාසයකම සෑම දෙනාටම මේ මුදල ලබා දෙන්න කටයුතු කළා. ඒ නිසා ඒ පිළිබඳව කිසිම තර්කයක් ගැටලුවක් නැහැ. ඒ පිළිබඳව ජනාධිපතිතුමා ඇතුලු රජයට අපි ගෞරවය මේ වෙලාවෙ පුදකරනවා.

ඒ වගේම කවුරු මොනදේ කතා කළත්, නාගොඩ ප්‍රාදේශීය සභාව සභාවක් හැටියට, මම දන්නෙ නැහැ කොච්චර දුරට සාර්ථක වුනාද? අසාර්ථක වුනාද? කියලා. නමුත් අපි වැඩපිළිවෙලක් දියත් කළා. මන්ත්‍රීවරු කීප දෙනෙක් සම්බන්ධ වුනා. විශේෂයෙන් මම පැහැදිලි කිරීමක් කළ යුතුයි. එළවළු වැඩසටහන සභාවේ ගරු සභාපතිවරයා සමග උප සභාපතිතුමත්, මමත්, මන්ත්‍රීවරු කීප දෙනෙක් ඒ කටයුත්ත සඳහා සහයෝගය දැක්වූවා. චක්‍රලේඛයක් මගින් ගරු සභාපතිතුමාට ගිය මාසය තුල වියදම් දැරීමට ආණ්ඩුකාරවරයා විසින් සම්පූර්ණ බලතල පවරලා තියෙනවා. ඒ අනුව ජන ජීවිතයට වාසිදායක තත්වයක් ඇතිවෙනවා. ව්‍යාපෘති කරන්න සභාපතිතුමාට ආණ්ඩුකාරතුමා විසින් බලය ලබා දී තියෙනවා. ඒ සභාපතිවරයාට දීපු බලතල අනුව අපිත් මේකට එතුමට සහයෝගයක් දැක්වූවා. එළවළු ප්‍රමාණයක් අපි මේ සභාවට ගෙනැල්ලා බාන කොටම කණ්ඩායමක් ඒක Facebook මගින් විවේචනය කරමින් හිටියා. මොකක්ද කොහොමද වුනේ කියලවත් කවුරුවත් හෙව්වෙ නැහැ. සභාවක් හැටියට ඒ විරෝධය ප්‍රකාශ කරපු අය සම්බන්දයෙන් අපි කතා කරන්න ගියේ නැහැ. අපේ කොට්ඨාසවලට නම් අපි එළවළු ලබා දුන්නා. ඒ වගේම මේ නාගොඩ ප්‍රදේශීය සභාව තුල විතරක් නෙවෙයි සෑම තැනම ඒ වෙන කොට එළවළු මිල අධික ලෙස ඉහල ගිහින් තිබුනා. නමුත් අපි සභාවෙන් එළවළු ගෙනාවට පස්සෙ ඒ මිල සීග්‍රයෙන් පහල බැස්සා. ඒ වගේම එළවළු ප්‍රමාණයක් අපි ගෙනාවා. සභාවෙ වාහනවලින් ගෙවල්වලට ගෙනිච්ච එකත් ඇත්ත. නමුත් ඇත්ත වශයෙන්ම සභාවේ මන්ත්‍රීවරුන්ගෙ ගෙදරට ගෙනිහිල්ල බඩු දෙන්නෙ නැහැ. ඊලගට සභාවේ මොනව හරි කාර්යයක් කෙරෙනවනම්, අපේ මන්ත්‍රීවරුන්ගේ වගකීම සහ යුතුකම තමයි ඒකට සහයෝගය දැක්වීම. මේ වෙලාවෙ හැම කෙනාටම පනිවිඩ කියන්න බැහැ. ඇවිල්ලා, හොයලා බලන්න ඕන. ඒ නිසා අපට මෙතනින් මොනව හරි ගන්න දෙයක් තියෙනව නම් ඒ දේ ගැනීම අපේ යුතුකම සහ වගකීම. ඒ වගේම මේකෙන් මට ලැබිච්ච වරප්‍රසාධයක් නැහැ. මම එළවළු ගෙන්න ගියා. මම ඒ කටයුත්තෙ හිටියා. උප සභාපතිතුමා ගියා. ගයාන් මන්ත්‍රීතුමා ගියා. ඒ වගේම එදා රාත්‍රී අපට ප්‍රියන්ති මන්ත්‍රීතුමිය කෑමත් ගෙනැල්ලා දුන්නා. එළවළු පාර්සල් කරන වෙලාවෙ එවැනි සහයොගයක් අපට මන්ත්‍රීවරුන්ගෙන් ලැබුනා. ඒ වගේම විනිවිධ භාවයෙන් ඒ කටයුත්ත කරගෙන යද්දි ඒකට හැමෝගෙම සහයෝගය ලැබුනනම් ඔයිට වැඩිය ප්‍රතිලාභයක් දෙන්න තිබුනා. අද අහනවා ප්‍රතිලාභ මොනවද දෙන්නෙ කියලා. ඉතිං දෙන ප්‍රතිලාභයට සහයෝගයක් දක්වාල ඒක තමන්ගෙ කොට්ඨාසවල බෙදන්න ඉඩ සලසා

ගත්ත නම් ඉවරයි. ඊලගට අපි සතොස මගින් ඒ වගේම පුද්ගලික ආයතන මගින් බඩු මලු විශාල ප්‍රමාණයක් මේ කොට්ඨාසය තුල බෙදා හැරියා. ඒ වගේම ඒ තැන්වලින් මිලදී අරගෙන අපේ කොට්ඨාසවල අපි බෙදා හැරියා. සභාවක් හැටියට මේ කොරෝනා වෛරසයේදී අපට මුහුන දෙන්න තියෙන විදියට මේ වෙලාවෙදි අපි යම් උත්සාහයක් ගත්තා. ඒක අසාර්ථක වෙන්න ඇති නමුත් අනිත් සභා වගේම අපිත් කටයුතු කළා. වෙන සභාවල ඒක ප්‍රවර්ධනය කරන්න කණ්ඩායමක් හිටියා. මේකෙ ප්‍රවර්ධනය කරන්න කණ්ඩායමක් හිටියෙ නැහැ. මේකෙ සජීවී විකාශයක් විදිහට මේකෙ අනිත් පැත්ත තමයි ගියේ. ඒ කැලල මහජන නියෝජිතයො හැටියට මේ මන්ත්‍රීවරු 27 දෙනාටම තියෙනවා. ඒ නිසා ඒවයි කතා කරපු මින්ස්සු කියපු දේවල් දකිනවා. මම දන්නෙ නැහැ මන්ත්‍රීවරයගෙ කාර්යය භාරය මොකක්ද කියන එක. ඒ වගේම මන්ත්‍රීවරු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්‍ෂා කරන්න බැදී ඉන්නවා. මේවා දිගට කතා කරන්න වෙලාවක් නෙවෙයි මේක. ඒ නිසා මන්ත්‍රීවරුන්ගේ කාර්යය භාරය පිළිබඳව තම තමන්ම හිතා ගත යුතු වෙනවා.

ඒ වගේම මේ වෙලාවෙදි තවත් කාරණයක් සඳහන් කරන්න ඕන. ධර්මසිරි මන්ත්‍රීතුමා අපි දෙන්නත් කලින් ඔහුගෙ කොට්ඨාසය තුල සියලුම දෙනාට බීජ ලබාදීලා, ලොකු වැඩපිළිවෙලක් කොට්ඨාස මට්ටමින් එතුමා කරන කොට අපිත් සභාවේ ගරු සභාපතිතුමාගෙ නායකත්වයෙන් බීජ ප්‍රමාණයක් ගෙනැල්ලා, ඒ ප්‍රමාණය හැම කෙනාටම මන්ත්‍රීවරුන්ට කොට්ඨාසෙකට ග්‍රාම නිලධාරී වසමකට දෙන්න පුලුවන් ප්‍රමාණෙකට ඒ ප්‍රමාණයක් පක්‍ෂ විපක්‍ෂ සියලුම දෙනාට යම් ප්‍රමාණයක් දීලා බීජ ප්‍රමාණයක් අපේ සභාවෙන් අපට නොමිලේ ලබා දෙන්න අවකාශ අපට සැලසුනා. ඉතිං ඒ වගේ වැඩපිළිවෙලකුත් අපි ක්‍රියාත්මක කළා. ඉදිරියෙදි ඊලග සභා වාරයට ඒ සම්බන්ද සවිස්තර වාර්තාවක් සභාපතිතුමා විසින් ඉදිරිපත් කරාවි. ඒ නිසා මම පැහැදිලිව කියනවා. අපි නාගොඩ ප්‍රාදේශීය සභාව හැටියට ඒ වගේම රජයක් විදිහට මේ සඳහා සාර්ථකව මුහුන දුන්නා. ඒ වගේම විශේෂයෙන්ම අගය කළ යුතුයි. නාගොඩ ප්‍රාදේශීය ලේකම්තුමිය. එතුමිය කාන්තාවක් වුනත් ඇය මම දැක්කා. හැම අවස්ථාවෙදිම නිවාඩු වෙලාවෙද, නැති වෙලාවද කියලා නැහැ. හැම වෙලාවෙම කාර්යාලයේ රැදී සිටිමින් අවශ්‍ය නායකත්වය සහනාධාර ලබාදීම් ප්‍රශ්නවලට හැම දේටම එතුමිය ලොකු සහයෝගයක් ලබා දුන්නා. නාගොඩ ප්‍රාදේශීය ලේකම් තුමියටත් මගේ ගෞරවය මේ වෙලාවෙ පුද කරනවා. ඒ වගේම ග්‍රාම නිලධාරීවරු, සමෘද්ධි සංවර්ධන නිලධාරීවරු, ආර්ථික සංවර්ධන නිලධාරීවරු, පවුල් සෞඛ්‍ය සේවිකාවන් ඒ සියලු දෙනාම මේ කාර්යයේදී ලොකු කාර්යය භාරයක් ඉෂ්ඨ කළා. ඒ සියලු දෙනාට අපි මහජන නියෝජිතයන් හැටියට අපේ ගෞරවය මේ වෙලාවෙදි පුද කරනවා. ඒ වගේම අපි මොන දේ කළත් මහජනතාව සියල්ල බලාගෙන ඉන්නෙ. අවසානයේ අපි මහජනයා ලගටයි යන්න ඕන. ඒ නිසා මීට වැඩිය ක්‍රමවත් භාවයකින් මේ වැඩපිළිවෙලවල් සියලු දෙනාගේ එකගතාවයෙන් සියලු දෙනා එකතු වෙලා සාකච්ඡා කරල මේ කටයුතු කරන්නට සියලු දෙනාට ශක්තිය ධෛර්යය ලැබේවා කියල ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා**

ගරු සභාපතිතුමනි, සමස්ථ සභාවෙන් අවසරයි. අපේ සහෝදර මන්ත්‍රී තරංග සුදර්ශන මහතා නිවාඩු අනුමත කරල දෙන්න කියලා ඉල්ලීමක් කරල තියෙනවා. එතුමාට නිවාඩු අනුමත කරල දෙන්න කියල මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම මමත් පොඩ්ඩක් කතා කරන්න ඕන. ලක්රුවන් මන්ත්‍රීතුමා කියපු අදහස් ටිකට මගේ නම පොඩ්ඩක්වත් කියවුනේ නැහැ. මගෙත් වාහනේ දුන්නා. ලොකුවට උදවු පදවු කරන්න වුනේ නැහැ. මමත් ඇවිල්ලා එලවළු ටිකක් අරගෙන ගියා. හොඳ දෙයක් කරනවනම් හොඳයි. හොඳ ප්‍රතිඵල ලැබේවි. මමත් රු. 35000.00 ක බීජ ගෙනැල්ල මගේ කොට්ඨාසෙ බෙදුවා. ඒ වගේ දේවල් කරනවනම් හොඳයි. පසුකාලීනව හරි සභාවක් හැටියට ඒ දේවල් කළා. බීජ බෙදීමෙදි අඩුපාඩුකම් තිබුනා. සියලු දෙනාටම බෙදා දෙන්න බැරි වුනා. කොට්ඨාසෙකට 20 ක් 30 ක් වගේ ලබා දීල තිබුනෙ. ඉතිං ඒ වගේ ක්‍රියාවක් කළා නම් මම හිතන්නෙ ඉතා වැදගත් වෙනවා. පසුව

හරි කරපු එක ගැන සතුටට පත්වෙනවා. ඉතිං සියලුම දෙනා මේ කොරෝනා වසංගතයෙන් අපේ ප්‍රදේශය බේරිලා තියෙනවා. ඒ වගේම ඉදිරියටත් මේ රජය කරන වැඩකටයුතුවලට සහයෝගය දීලා, කට බැඳගෙන හරි ඇවිදලා මේ කටයුතුවලට සහයෝගය දක්වන්න කියලා ඉල්ලා සිටිනවා. පක්ෂ විපක්ෂ නැතුව හැම සාකච්ඡාවකටම සියලු දෙනා එකතු වුනා. අපේ ධනංජය මන්ත්‍රීතුමා කිව්ව වගේ කතා කළානම් ඒ දේ තමයි සිද්ද වෙන්න ඕන. ඒක නොවීම පිළිබඳ පොඩි පොඩි අඩුපාඩු කම් තියෙනවා. ඒව පසුව කතා කරමු. එහෙමනම් සියලු දෙනාට තෙරුවන් සරණ ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, මට පොඩ්ඩක් ලක්රුවන් මන්ත්‍රීතුමාගෙ කතාවෙ ප්‍රතික්ෂේප කරන්න ඕන තැනක් තියෙනවා. නැත්නම් අපි සියලුම දෙනා ඒකට අහුවෙනවා. ඒ පිළිබඳ විග්‍රහයක් කරන්නනම් ඊලග සභාවාරය,ට නැත්නම් කාලය ගත වෙනවා. මම කතා කරන්න ගියොත් විනාඩි 45 ක් විතර ගන්න වෙනවා. සභාපතිවරයා කැඳවපු කොරෝනා පනිවිඩය ඇවිල්ලා සභාපතිවරයා කැඳවපු සෑම සාකච්ඡාවකටම සියලු මන්ත්‍රීතුමන්ලා මෙතනට සම්බන්ද වුනා. රාත්‍රී ආව දවාලෙ ආවා. සහයෝගෙත් පූර්ණ දෙන්නම් කිව්වා. ඕන දෙයක් කරන්න කිව්වා. අනුමැතිය අපි දෙන්නම් කිව්වා. ඕනම දෙයකට අපි එන්නම් කිව්වා. නමුත් ඊට පසුව ක්‍රියාත්මක වුන කිසිම දෙයක් පිළිබඳ අපි දැනුවත් වුනේ නැහැ. ඔය එලවළු ගේන එක හොඳ හෝ නරක දෙන්න තුන්දෙනෙක් අතරෙ සාකච්ඡා වෙල ක්‍රියාත්මක වෙල තියෙනවා. ඒ පිළිබඳ මම කතා කරන්න යන්නෙ නැහැ. ඒ දෙන්න තුන්දෙනා සාකච්ඡා කරල ඒ වැඩේ කරගෙන ගිහිල්ල තියෙනවා. අපි මෙතන සාකච්ඡා කරපු එකම දෙයක්වත් ප්‍රතික්ෂේප කරයි කියන එකවත් පනිවිඩය අපිට ලැබුනෙ නැහැ. ඒකට වුනේ මොකද කියලවත් අපි දන්නෙ නැහැ. ඒක නිසා මේ ගරු මන්ත්‍රීතුමන්ලා, පක්ෂ විපක්ෂ සියලු දෙනාම සහයොගය දුන්නයි කියන වචනය වහාම වාර්තාවෙන් ඉවත් කරන්න. අපි රාත්‍රී හැම වෙලාවකම මෙතනට සම්බන්ද වෙන්න ආවයි කියන එක අනිවාර්යයෙන් ඒක කියනවා. ගරු සභාපතිවරයට සහයෝගය දෙන්නත් ප්‍රදේශයට සහයෝගය දෙන්නත් හැම වෙලාවකම මෙතනට ආවයි කියන එක අපි කියනවා. ඒ වෙලාවෙ අපි පක්ෂයකට බැඳුනෙ නැහැ. පක්ෂයක් ගැන කතා කළේ නැහැ. ප්‍රතිඵල එන කොට අපි කිසිම මන්ත්‍රීවරයෙක් 80% ක් ඒක දන්නෙ නැහැ කියන එකත් මම කියනවා. කතන්දරේ මෙතනින් එහාට මම ගෙනියන්නෙ නැහැ. ඊලග සභාවට කතන්දරේ දෙන්නම්. එහෙනම් මේ කොරෝනා වසංගතයෙන් අපට හෙට දවසේ කිසිම කෙනෙකුට කරදරයක් නොවී සුවය ලැබෙන්න ප්‍රාර්ථනය කරමින්, රජය ගෙනයන හොඳ වැඩපිළිවෙලවල් විතරක් අපි අනුමත කරනවා. නරක වැඩපිළිවෙලවල් අපි කිසිසේත්ම අනුමත කරන්නෙ නැහැ. දේශපාලනීකරණය අපි අනුමත කරන්නෙත් නැහැ කියල මම නිහඬ වෙනවා. තමුන්නාන්සෙලා සියලු දෙනාට ස්තූතියි.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සමස්ථ සභාවෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, එක එක්කෙනාට එක එක වෙලාවල් වුනාට මම නම් වැඩි වෙලා ගන්නෙ නැහැ. ගරු සභාපතිතුමනි අපි මෙවර පුරං කුඹුරු අක්කර 40 ක් කරගෙන යනවා. ඒකෙදි අපි පුරං කුඹුරු හිමියන්ගෙන් අරගෙන එක එක්කෙනාට 10, 05 වගේ බෙදල දුන්නා. අපේ 215 බී වසමට ජනතාවට මෙම කුඹුරු ලබා දුන්නෙ රොටරි කරලා, ඒ වගේම සියලුම දේ නොමිලෙ තමයි මේ සැරේ ලබා දුන්නෙ. එම නිසා ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙන් මම ඉල්ලන්නෙ මේ අයාලේ යන ගවයන් ටිකක් ඉන්නවා. අන්න ඒ ගවයන්ට මොකක්ම හරි ක්‍රියාමාර්ගයක් ගන්න කියලා. නැත්නම් අපි මේ කරපු වැඩෙන් වැඩක් නැතිවෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඒ ඉල්ලීම කරනවා.

ඒ වගේම තමයි කියන්න වෙනවා. අපේ මේ ලක්රුවන් මන්ත්‍රීතුමා කතා කළා මේ සමෘද්ධිය ගැන ඇත්තටම සමෘද්ධි දීමනාව දීම ගැන නම් කතා කරන්නෙ නැහැ. අපේ ප්‍රදේශවල රුපියල් 5000 මුදල දුන්නෙ දෙන්න ඕන අයටත් නෙවෙයි. විශ්‍රාම ගන්න අයට දෙන්න ඕන නැහැ කිව්වා. හමුදාවෙ නිලධාරීන් ඉන්න තැන්වලට දෙන්න ඕන නැහැ කිව්වා. නමුත් දුන්නෙ ඒ තැන්වලට. ගරු සභාපතිතුමනි, ලැලි ගහපු ගෙදර ඉන්න මනුස්සයට දුන්නෙ නැහැ. මම ඒ ගැන කතා කරන්නෙ නැහැ. ගරු සභාපතිතුමනි, ඔබතුමාට අපි ආරාධනා කරනවා. පහළොස් වෙනිදා උදේ හතට තමයි අපේ වප් මගුල් උත්සවය තියෙන්නෙ. එදිනට ඔබතුමාටත් ආරාධනා කරමින් මේ කොරෝනා වසංගතය දුරින් දුරුවේවායි කියල ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

ගරු උපසභාපතිතුමා ඇතුලු මන්ත්‍රීවරුනි ප්‍රතමයෙන්ම මම ධනංජය මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ කාරණය පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න ඕන. එතුමාගේ ප්‍රකාශය අනුව නාගොඩ ප්‍රාදේශීය සභාව සතුව ඇති කිසිම භෞතික සම්පතක් හෝ දේපොලක් කිසිම ආකාරයකින් අන්සතු කිරීමට මම මේ තනතුර දරනකම් ඉඩ නොදෙන බව මේ අවස්තාවේ ප්‍රකාශ කරනවා. ගරු මන්ත්‍රීවරුන් මේ පිළිබඳ යම් වැරදි වැටහීමක් ඇති කර ගනී කියන අදහස හින්දා මම මේක ප්‍රතමයෙන්ම ප්‍රකාශ කළේ. අප සභාව සතු, භුක්ති විදින යම් දේපොලවල් පිළිබඳව හා සමහර එම භුක්ති විදින දේපොලවල නීත්‍යානුකූල අයිතිය අප සභාව සතු නොවන බව ඔබතුමාල දන්නවා ඇති. මම මේ අවුරුදු දෙක තුල එම දේපොලවල පරම අයිතිය සභාව සතු කර ගැනීමට කටයුතු කරන බවත් මේවන විට එම කටයුත්ත 90% කින් පමණ වැඩ අවසන් බවත් සතුටින් කියන්න කැමතියි. මම මේ පිළිබඳව මීට ප්‍රතම සිටි සභා ලේකම් වරියට ස්තූති කරන්නත් මේ අවස්තාව කරගන්නවා. මන්ද ඇය තමයි මේ පිළිබඳව සොයා බලල(අපි සභාවේ නොසිටි කාලයේ)කටයුතු ආරම්භ කළේ.

ධනංජය මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ කාරණයට අදාලව ඇප්ත්‍රොප් වත්තෙ වර්ථමානයේ අපට අයත් අක්කර 05 භූමිභාගයේ කිසියම් අයෙකු විසින් තේ පැල සිටුවීමක් පිළිබඳව එහි මුර සේවකයෙක් මාව දැනුවත් කළා. මම එම ස්ථානය නිරීක්ෂණය කරන්න ගියා. එය ඇත්තක් බව පෙනුනා. නමුත් එම පැල සිටුවා තිබෙන්නේ මීට මාස කිහිපයකට කලින් බව පෙනුනා. මුරකරුවන් මේ පිළිබඳව මාව දැනුවත් කළේ මෙයට දවස් කීපයකට කලින්. ඔවුනුත් දැනගත යුතුයි සිදුවීම් සිදුවෙන කොට සභාව දැනුවත් කරන්න. ඒ නිසා කලින් අප ප්‍රාදේශීය සභාවට අයත්ව තිබූ අක්කර 35 ක භූමි ප්‍රමාණයම නැවත ප්‍රාදේශීය සභාව සතු කරගැනීමට කටයුතු කරනවා මිසක් බිම් අගලක්වත් අන්සතු වීමට මෙම කතා කරන නාගොඩ විතාන ඉඩ නොතබන බවට මම නැවතත් ප්‍රකාශ කරන්න කැමතියි.

ඒ වගේම තමයි අප සභාවට අයත්යයි පවසන නමුත් නීත්‍යානුකූල අයිතිය නොමැති පිට්ටනි පිළිබඳවත් සඳහන් වුනා. එහි වගකීමත් අපි අරගෙන ඒවායේ අයිතියද යථා කාලයේ සභාව සතු කරගැනීමට කටයුතු කරන බව සඳහන් කරන්න කැමතියි. මම පහුගිය කාලයේ ඉහත සඳහන් කළ පිට්ටනියේ උඩුගම - නාගොඩ මාර්ගය සංවර්ධනය කරන කොන්ත්‍රාත් කරුට ගල් ගබඩා කිරීමට සභාව දැනුවත් කොට අවසර දීමට කටයුතු කළත් එයට විරුද්ධත්වයක් දැක්වූයේ මේ කතා කරන ධනංජය මන්ත්‍රීතුමා. මන්ද මෙම කොන්ත්‍රාත් කාර සමාගම අපට පොරොන්දු වුනා අවුරුද්දක් ගිය තැන ක්‍රීඩාපිටියට යන මාර්ගය සහ ක්‍රීඩාපිටිය ප්‍රදේශයේ දරුවන්ට අගනා ක්‍රීඩාපිටියක් ලෙසට සංවර්ධනය කරන බවට. එය එසේ වුනානම් අද මේ කියන අවනඩුව මේ සභවේ ප්‍රකාශ වන්නේ නැහැ. වෙරංග මන්ත්‍රීතුමා මෙයට සාක්ෂි දරනවා ඇති.

ගරු මන්ත්‍රීවරුනි මේ වන විට අපේ රටට මෙන්ම අන් රටවලත් මහා ව්‍යසන තත්වයක් ඇති වෙලා තියෙන බව අමුතුවෙන් කිවයුතු නැහැ. අද දින සභාව පවත්වනුයේත් මේ ඇතිවී ඇති තත්වය හමුවේ සෞඛ්‍ය උපදෙස් අනුවයි. මෙම තත්වයන් උඩ සභා රැස්වීම නොපවත්වා සිටීමට වුනත් පුලුවන්. නමුත්

අපි සාමූහික වග කීමක් ගත යුතු බැවින් සෞඛ්‍ය උපදෙස් අනුව සභාව පවත්වන්න මම කල්පනා කළා. මීට ප්‍රතම අපි සියලුම මන්ත්‍රීවරු කැදවා සාකච්ඡා කොට යම් යම් තීරණ ගත්තා. ඒ අවස්ථාව වන විට අපිට ප්‍රභලව දැනුනේ අධික නියගය නිසා ඇතිවී ඇති ජල ප්‍රශ්නය. නමුත් මම ඒ අවස්ථාවෙත් ප්‍රකාශ කළා. වර්ථමානයේ ඇතිවී ඇති කොරෝනා වසංගතය පිළිබඳව දැඩි අවධානයක් ගත යුතු බව. නමුත් ඊට වඩා ජල ප්‍රශ්නය උග්‍රවීම නිසා ඒ පිළිබඳව වැඩි සැලකිල්ලක් ගැනීමට අපට හැකිවුනේ නැහැ. යම් මූල්‍ය ප්‍රතිපාදනයක් ලබා ගැනීමට මේ පිළිබඳව මම ගරු ආණ්ඩුකාරතුමාවද දැනුවත් කරනු ලැබුවා. ඒ අනුව ගරු ආණ්ඩුකාරතුමා රුපියල් ලක්ෂ 10 ක මුදලක් ලබාදීම තුල එම මුදලෙන් අපි පීඩාවට පත් ජනතාවට කළ යුත්තේ මොනවාදැයි කියා කතා කරගන්න තමයි. දෙවනුව මම සියලු පක්ෂ විපක්ෂ මන්ත්‍රීතුමන්ලා කැදවා සාකච්ඡාවක් කළේ. ඒ අනුව එදින සාකච්ඡා වුන පරිදි නොමිලේ වියලි ආහාර මල්ලක් ලබා දීමටත් ඒවා ග්‍රාමීය කමිටු මගින් ලබාදීමට සුදුස්සන් තොරා ගැනීමට යෝජනා වුනා. නමුත් මම මෙයට එතරම් කැමැත්තක් නොදැක්වුවත් අන් අයගේ අදහස්වලට ගරු කර නිශ්ශබ්දව හිටියා. මන්ද මට පෙනුනා මේ කොරෝනා වසංගත තත්වය ක්ෂණිකව අවසන් නොවන බව. ගංවතුරක් හෝ වෙනත් ආපදාවක් වුනා නම් එය දවස් දෙක තුනකින් හෝ සුමානයකින් යථා තත්වයට පත්වෙනබව අපි දන්නවා. අපට ලැබුන ලක්ෂ 10 ක මුදලින් අපි කෙසේද පවුල් 17000 ක් වෙසෙන බල ප්‍රදේශයේ පවුල් තෝරන්නෙ. සාමාන්‍යයෙන් රුපියල් 1000 ක බඩු මල්ලක් දීමට වුවත් පවුල් 1000 යි. ග්‍රාම සේවා වසම් 53 යි. ගමකින් පවුල් 20 ක් පමණයි තෝර ගන්න වෙන්නෙ. මෙවැනි තෝරා ගැනීමක් කිරීමට අපි ගියානම් අසරණ වෙන හැටි, වර්ථමාණයේ රපියල් 5000 දීමේදි ඇතිවෙන ගැටලු ගැන බැලුවම පෙනේවි.

තවද අපේ සමහර මන්ත්‍රීවරු පැවසූ ආකාරයට සභා දෙකක හැර කිසිම ප්‍රාදේශීය සභාවක් නොමිලේ කිසිවක් ලබා දී නැහැ. සහන ක්‍රමවේදවලට වියලි ආහාර මලු ලබා දී තිබුනා. මගේ කැමැත්තත් වුනේ එසේ කිරීමට. මේ පිළිබඳව මම පළාත් පාලන කොමසාරිස් තුමාද දැනුවත් කළ පසු ඔහුද මගේ අදහස අනුමත කළා. තවද මෙම රුපියල් ලක්ෂ 10 අපට ලබා දී ඇත්තේ සභා මුද්දර ගාස්තු හැටියටයි. ඒ සමගම මෙම ලක්ෂ 10 වියදම් කරන ආකාරය පිළිබඳව ගරු ආණ්ඩුකාරතුමා මගින් චක්‍රලේඛයක් එවා තිබුනා. පළමුව ජලය බෙදා හැරීමට, දෙවනුව වසංගත තත්වය හමුවේ අසරණවී සිටින ජනතාවට සහනදායී ලෙස ආහාර ද්‍රව්‍ය ලබාදීම, විෂ බීජ හරනය ආදී දේවලට, තවද නිරෝධායනයට ලක් වූ පවුල් වලට නොමිලයේ ආහාර මල්ලක් ලබා දීම සහ ගෙවතු වගා කරුවන් දිරිමත් කිරීම ආදිය. ඒ අනුව තමයි අපි උප සභාපතිතුමා ප්‍රමුක මන්ත්‍රීතුමන්ලා කිහිපපොලක් එකතුව තීරණයක් ගත්තෙ සහනදායී ලෙස එලවලු මල්ලක් ලබා දීමට. ඒ අනුව අපි බෙලිඅත්තෙ, රන්න ආදී ප්‍රදේශවලින් එලවළු රැගෙනවිත් නිදිවරාගෙන සභා සේවකයන් නිලධාරීන් සමග එලවළු මලු සකසා ගෙන්ගෙට ගොස් අලෙවි කළා. එහිදී අපට පාරිභෝගික ජනතාවගෙන් ගුණාත්මක ප්‍රතිචාර ලැබුන බවත් පවසන්නේ සතුටින්. තවද සතොස ආයතනයේ අපි ඇණවුම් කළ සහන මලු අවශ්‍ය ප්‍රමාණයට නොලැබුන නිසා ඒවා නිසි පරිදි බෙදා හැරීමට හැකි වූයේ නැහැ. ලැබුන සියල්ල සාධාරණ ලෙස බෙදා හැරි බවයි මගේ විශ්වාසය. මෙහිදී මට සහය දැක්වූ උප සභාපතිතුමා මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලා ඇතුලු සියලු දෙනාටත් ස්තූති කරන්න මේ අවස්ථාව කර ගන්නවා.

මම කියන්න කැමතියි මේ ලගකදි ඉදලා නාගොඩ සභාවේ අපි කියලා මුහුණු පොතේ යන ඒවා පිළිබඳව. මම මුහුණු පොත සමග සම්බන්දයක් නැති නිසා මේ සදහන් දේවල් සත්‍ය දැයි කියා මේවා දකින උදවිය මා සමග ප්‍රකාශ කළා. එවිට තමයි මා දැනුවත් වූයේ යම් අසත්‍ය ප්‍රචාර සහ වැරදි වැටහීම් සහිත දේ මෙහි සදහන් වන බව. මම අහන්න කැමතියි අප සභාවේ නම සදහන් කොට ගෙන යන මෙම ක්‍රියාවට සභාවේ මන්ත්‍රීතුමෙකු මනත්‍රීතුමියක් දැනුවත්ද කියා. නැත්නම් සභාවේ නිලධාරියෙකු හෝ සේවකයෙකු සම්බන්දද කියා. මෙම ක්‍රියාදාමය තුලින් සිදු වන්නේ සමස්ථ සභාවම හැල්ලුවට ලක් වීමයි. ඔය මුහුණු පොතේ වීරයන්ට මම කියනවා. පුලුවන්නම් මට කෙලින්ම පහර ගහන්න. මම

මේ වන තෙක් වැරදියි කියන යමක් හෝ ක්‍රියාවක් නොකළ නිසා පෙර වැරදි කළ අයට වගේ මට මඩ ගහන්න එන්න එපා. තමන්ගෙ අතේ මඩ සෝදා ගන්න. සමහරු වෙනත් සභා පිළිබඳව සඳහන් කරලා අපේ සභාව සංසන්දනය කරන්න හදනවා. මතක තියා ගන්න අපි කරන වැඩ ෆොටෝ ගහල Facebook දාන්න ගියේ නැහැ. දෙරණ සමග එකතුවී මගේ ඉල්ලීමකට පන්සල් 54 කට වියලි ආහාර මලු බෙදා දීම සිදු කළා. එලවළු බීජ ඇට අනුරාධපුරයේ ගොස් ගෙනවිත් දවස් ගානක් පැකට් කරලා මන්ත්‍රීවරු සභා නිලධාරීන් සමග හැම ගමකටම බීජ වර්ග අටක් සමග පැකට් 30 බැගින් බෙදා දුන්නත් Fb දැම්මෙ නැහැ. බීමට ජලය නොමැති ප්‍රදේශවලට ජල ටැංකි 15 ක් අවශ්‍ය ස්ථානයන්හි තබා මාස දෙක තුනක් ජලය බෙදා දුන්නත් Fb දැම්මෙ නැහැ. මෙම ජල ටැංකි අලුතින් අපට ලබා දුන්නෙ ගරු ආණ්ඩුකාරතුමා මගේ බලවත් ඉල්ලීමට. මන්ද යත් අපේ සභාවේ තිබූ ජල ටැංකි 17 න් වර්තමානයේ තියෙන්නෙ ටැංකි දෙකයි. අනිත් ඒවාට වූ දේ දැන් සිටින පරණ මන්ත්‍රීවරුන්ගෙන් ඇසුවොත් කියාවි. මම හිටපු පළාත් පාලන ලේකම්තුමා වර්තමාන කොමසාරිස්තුමා සමග සම්බන්ධවී මේ සභාවට ගෙන ආ ලොකු වතුර බවුසරය පිළිබඳව ඒ දවස්වල කිව්වෙ සභාවට සුදු අලියෙක් ගෙනාව කියලා. දැන් ඒ සුදු අලියා රත්තරං අලියෙක් වෙලා. ඒ බවුසරය නොතිබුනානම් අපේ ප්‍රදේශයේ ජනතාවගේ ජල ප්‍රශ්නය උග්‍රවී අපි අපහසුතාවයට ලක්වෙන්න තිබුනා. මන්ද බද්දෙගමට ගොස් ජලය රැගෙන ආවෙ. ඒ නිසා ජලය වෙනුවෙන්ද ලක්ෂ ගණනක් වෙන් කර ගත්තේ. මෙම ප්‍රශ්නය මුල් කරගෙන විශේෂිත වූ යෝජනාවකුත් ඉදිරිපත් කරනවා. අපට මේ හැම තැනකටම ජලය සපයා දීම අපහසුයි. විශේෂයෙන් ඌරල කොතේගොඩ කන්ද, උඩුගම අලුත් වත්ත මෙම ස්ථාන දෙකටම උග්‍ර ජල ප්‍රශ්නයක් ඇති බව අපට පෙනුනා. එබැවින් විශේෂිත කාරණයක් හැටියට සලකා මෙම පෙදෙස් දෙකේ ජල ප්‍රශ්නය විසඳීමට ඉහල දේශපාලන නායකයන් දැනුවත් කොට හැකි ඉක්මනට විසඳුමක් ලබාදීමට, විශේෂයෙන් වර්තමාන ජනාධිපති අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිඳුන්ගේ පළමු අභිප්‍රාය තමයි ශ්‍රී ලංකාවාසී සියලු ජනතාවට අවශ්‍ය පානීය ජලය ලබා දීමට කටයුතු කිරීම. එතුමා පසු ගියදා උඩුගම හෝමදොල ගමට ආපු වෙලාවෙ ප්‍රකාශ කළෙත් මෙයමයි.

තවද අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිඳුන්ගේ සංකලනයෙන් වර්තමානයේ ඇතිවී ඇති කොරෝනා වසංගත තත්වයෙන් රට බේරා ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව ලෝක නායකයින්ගේ මෙන්ම ලෝක සෞඛ්‍ය සංවිධානයේද ප්‍රසංසා ලැබීම අපට ශක්තියක්. මෙම නායකයින්ගේ වටිනාකම තේරෙන්න මේ වසංගතයෙන් ජනතාව ආරක්ෂා කර ගන්න යොදා ඇති ක්‍රියාමාර්ගවලින් ලෝකයේ දෙවැනි තැනට පත්වීමම ඇති. ඒ වගේම අපේ රටේ අසරණ වූ සියලු පවුල්වලට රුපියල් 5000 ගණනේ බෙදා දීමට කටයුතු කිරීම. මතක තියා ගන්න රජයේ රැකියා විශ්‍රාමික ඉහල පෙළේ ව්‍යාපාරික අයට හැර ලංකාවේ සෑම පවුලකටම රුපියල් 5000 ලබා දුන්නා. එහෙම නැහැ කියනවානම් මම මේ තනතුරෙන් ඉල්ලා අස්වෙන බව කියන්න ඕන. රජයේ රැකියා හො විශ්‍රාමිකයින් ඉන්නා පවුල්වලටත් අනු පවුල් යටතේ මෙම දීමනාව ලබා දුන්නා. වකුගඩු, අබාධිත, වැඩිහිටි දීමනා, මේ 5000 ට අමතරව ලබා දුන් බවත් කියන්න ඕන. මේ කොරෝනා තත්වය සමනය වෙනකම්, රට යථා තත්වයට පත් වෙනකම් මෙම දීමනාව ලබා දෙන බවත් අපි කියනවා. මෙයට කිසිම දේශපාලන අත පෙවීමක් නොකළ බවත් කියන්න ඕන. මන්ද අද ප්‍රකාශ වුනා ප්‍රදේශයේ මන්ත්‍රීතුමා මෙයට සම්බන්ධයි කියලා. ඔව් මන්ත්‍රීතුමා ග්‍රාම නිලධාරී සමෘද්ධි නිලධාරී ආර්ථික සංවර්ධන නිලධාරී කෘෂි පර්යේශන නිලධාරී යන අය මෙම ග්‍රාමීය කමිටුව නියෝජනය කළා. ජනතාවගේ ප්‍රශ්නවලට උත්තර සපයන කමිටුවට ජනතා නියෝජිතයා සහභාගි වීම වැරදිද? ඒ නිසා අපේ ගරු මන්ත්‍රීවරු වැරදි වැටහීමක් ඇතිකර ගන්න එපා. මේ හැම දේම අපි කරන්නෙ සද්භාවයෙන්. පෘතග්ජන අපි අතින් වැරදි සිදුවෙනවා ඇති.

තවද මෙම වසංගතය හමුවේ තමාගේ රාජකාරිය දේව කාරියක් කොට සලකා පළාතේ ජන ජීවිතය යථා තත්වයට පත් කරන්න සෞඛ්‍ය ආරක්ෂා කරන්න කැපවූ දිසාපතිතුමිය ඇතුලු ග්‍රාම නිලධාරී

සමෘද්ධි නිලධාරී ආර්ථික සංවර්ධන නිලධාරී කෘෂි පර්යේශන නිලධාරී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන්, සෞඛ්‍ය සේවයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමන්ලා එම වෛද්‍ය අධිකාරීතුමා ඇතුලු සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සියලු දෙනාට, පොලිස් ස්ථානාධිපතිතුමා ඇතුලු සියලු පොලිස් නිලධාරීන්ට සහ විශේෂයෙන්ම දේශපාලන අධිකාරියේ ගරු අමාත්‍ය රමේෂ් පතිරණ මැතිතුමා සම්පත් අතුකෝරල හිටපු පළාත් සභා නියෝජ්‍ය සභාපතිතුමා හිටපු පළාත් සභා මනත්‍රී ඉසුරු දොඩංගොඩ මැතිතුමන්ලා ඇතුලු දේශපාලන අධිකාරියේ අනෙකුත් සියලු දෙනාටමත් දකුණු පළාත් ගරු ආණ්ඩුකාර විලී ගමගේ මැතිතුමාටත් ස්තුති කිරීම මගේ යුතුකමක්. මන්ද එතුමන්ලා මේ අවස්ථාවේ අපට අවශ්‍ය උපදෙස් ලබා දෙමින් ජන ජීවිතය යථා තත්වයට ගෙන ඒමට දැක්වූ සහයෝගය පිළිබඳව. අපි මේ ව්‍යසන අවස්ථාවේ කාට හෝ අහිතක් කරන්න විරුද්ධ පාක්ෂිකයන්ට අඩුවෙන් සලකන්න කිසිසේත්ම සිතන්නේ නැති බව කියන්න කැමතියි. මේ අවස්ථාවේ අපේ හැගීම විය යුත්තේ එක අම්මගෙ දරුවන්සේ මෙම ලෝක වසංගත ව්‍යසනයෙන් මිදෙන්නට මෙම රජය ගෙන යන වැඩපිළිවෙලට සහය දක්වා නැවත වරක් ලෝකයේ උතුම් රට ශ්‍රී ලංකාව බවට පත් කරන්න දායක වීමයි. එසේ කියමින් අද දින සභාවට සහභාගිවූ උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලා දුරස්ථ භාවය රැකගෙන මෙම සභාව ගෙන යාමට සහය දැක්වූ ලේකම් තුමිය ඇතුලු කාර්යය මණ්ඩලයට ස්තුති වන්ත වෙමින් සභාව මෙයින් නිම කරනවා. සැමට තෙරුවන් සරණයි.

සභාපති,
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී                    දිනය:- ..............................